12. වෙනත් සුදුසුකම් ඃ ..............................................................................................................................................
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය.)

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? ......................................................

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව් / නැත ...............................................
ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය : ...................................................

ඉහත සඳහන් අංක 01-14 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටකදී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහකිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.................................

*දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ............................................................... යන අය මෙම ආයතනයේ ....................................................... වශයෙන් ................................................ දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු / ඇය දරන තනතුරෙන් නිදහස් කළ හැක/ නොහැක. ඔහු / ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..................................................
ආයතනික ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව.

දිනය : ....................................

නම : ..........................................................
තනතුර : ......................................................
ආයතනය : ....................................................

10-120

## පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය/ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | සේවක ගණය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | ශිල්පීය නිපුණතා හා පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු | ප්‍රාථමික ශිල්පීය | 02 | PL3-2016 රු. 25790-10x270-10x300-10x330-12x350-රු. 38990 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 05ක් සමත් විය යුතුය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br>අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගින් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br>**පළපුරුද්ද :**<br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.) |
| 02 | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2016<br>රු.24,250-10x250-10x270-10x300-12x330- රු. 36410 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)<br>අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | |

03. *වයස :*

අයදුම්පත් කැඳවන අවසාන දිනට අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි අය විය යුතුය. (දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)

04. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

II. රජයේ ප්‍රතිපත්තිවලට ද, වයඹ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නීති වලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වයඹ පළාත් සභාව විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගවලට, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

III. වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

IV. තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය.

V. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ.

VI. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

VII. මුල් පත්වීම් දින සිට වසර තුනක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

VIII. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

IX. බඳවා ගැනීමෙන් පසු ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිදු දැනුම් දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ.

05. *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුය.)

III. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුය.

IV. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

V. පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් දීමනා පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.)

VI. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් හා රියදුරු තනතුර සඳහා නිපුණතාවය පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

07. මූලික සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය;
II. අධ්‍යාපන සහතික;
III. ජාතික හැඳුනුම්පත;
IV. රියදුරු තනතුර සඳහා වලංගු රියදුරු බලපත්‍රය;
V. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
VI. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්;
VII. වෘත්තිමය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
VIII. දැනටමත් සේවයේ යෙදෙන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකය.

09. *අයදුම්පත්*.- අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරගත් අයදුම්පත් 2018.10.26 වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සියලු බලතල පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේ ය.

ආර්.එම්.ටී.කේ. රත්නායක,
ලේකම්,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
පොල්පිතිගම.

**ආදර්ශ අයදුම්පත**

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

**.................................................. *තනතුර සඳහා බඳවා ගැනීම***

1. *(අ)* මුලකුරු සමග නම :.................................................................
2. *(ආ)* මුලකුරු වලින් හැඳින්වෙන නම් :.................................................................
3. ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයඃ.................................................................
4. ස්ථිර ලිපිනයඃ.................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :.................................................................
6. ස්ත්‍රී/පුරුෂ භාවයඃ............... විවාහක/අවිවාහක බවඃ...............
7. උපන් දිනය : අවුරුද්දඃ............... මාසයඃ............... දිනය :...............
2018.10.26 දිනට වයස : අවුරුදු :............... මාසඃ............... දිනඃ...............
8. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද/ලියාපදිංචියෙන් ද යනවග :.........................................................
9. ජාතිය :
10. දුරකථන අංකයඃ.................................................................
11. අධ්‍යාපන සුදුසුකම් :
i. අ.පො.ස.(සා/පෙළ) විභාගය - විභාග අංකය :............... වර්ෂයඃ............... මාසයඃ...............

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ii. අ.පො.ස.(උ/පෙළ) විභාගය - විභාග අංකය :............... වර්ෂය :............... මාසය:...............

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

12. වෘත්තීමය සුදුසුකම් : (සහතික මගින් සනාථ කළ යුතුය.) :......................................

13. සේවා පළපුරුද්ද :......................................

14. ඔබ කෙදිනක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:......................................

15. ඔබ දැනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ හෝ වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් :......................................

   i. දැනට දරන තනතුර :......................................

   ii. එම තනතුරට පත් වූ දිනය :......................................

   iii. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම):......................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර මා නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසුව ඒ බව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

.................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ................................................වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර නිර්දේශ කර ඉදිරිපත් කරමි.

............................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :............................................ .

10 - 347

## කටුනායක සීදුව - නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කටුනායක සීදුව නගර සභාවේ පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර සභාපති/ලේකම්, කටුනායක-සීදුව නගර සභාව, සීදුව යන ලිපිනයට 2018.10.26 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ අදාල තනතුර සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත්‍ර සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. තනතුරු නාමය | :- | පෙර පාසල් ගුරු III |
| බඳවා ගැනීමේ ක්‍රමය | :- | (විවෘත/සීමිත) |
| පුරප්පාඩු සංඛ්‍යාව | :- | 02 |
| වැටුප් පරිමාණය | :- | MN-1-2016(රා.ප.ච. 3/2016 අනුව)<br>(රු. 27,140-10x300-11x350-10x495-10x660- රු.45,540/-)<br>(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 21,532 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) |

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*අධ්‍යාපන සුදුසුකම්* :- (විවෘත අයදුම්කරුවන් සඳහා)

භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම සහ අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*අධ්‍යාපන සුදුසුකම්* :- (සීමිත අයදුම්කරුවන් සඳහා)

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනණකදී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුය.)

*වෘත්තීය සුදුසුකම්* :- (විවෘත/සීමිත අයදුම්කරුවන් සඳහා)

පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

(බස්නාහිර පළාත් පෙර පාසල් ප්‍රඥප්තියට අනුව සලකා බලන පාඨමාලා කාලය වසරක් වන බැවින් වසරක හෝ ඊට වැඩි පාඨමාලාවන් හදාරා ඇති අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

*පළපුරුද්ද* :- (සීමිත අයදුම්කරුවන් සඳහා)

අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ශ්‍රේණියක වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

*වෙනත් සුදුසුකම් :*

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(II) අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(III) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(IV) වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(VI) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ලිඛිත විභාගය :- (විවෘත/සීමිත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

විභාග ගාස්තු වශයෙන් රු. 1000.00 ක මුදලක් ගෙවිය යුතුය.

ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලබන අතර ආයතනික අවශ්‍යතාවය මත වයසින් අඩු හා මනා පෞරුෂයක් සහිත අයදුම්කාරියන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

*සැ.යු.*:- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. තනතුරු නාමය :- සෞඛ්‍ය පරිපාලක/වැඩ ක්ෂේත්‍ර පරිපාලක III
බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව :- 02
වැටුප් පරිමාණය :- MN-1-2016(රා.ප.ච. 3/2016 අනුව)
(රු.27,140-10x300-11x350-10x495-10x660- රු.45,540/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 21,532/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*අධ්‍යාපන සුදුසුකම්* :-

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම. සහ අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :- අදාළ නොවේ.

*පළපුරුද්ද* :- අදාළ නොවේ.

*කායික සුදුසුකම්* :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
*වෙනත් සුදුසුකම්* :-

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(II) අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.

(III) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(IV) වයස ඃ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(VI) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ලිඛිත විභාගය :-

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

* ලකුණු ලබා ගැනීමේ අනු පිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.
* විභාග ගාස්තු වශයෙන් රු. 1000.00 ක මුදලක් ගෙවිය යුතුය.

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-* මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

*ව්‍යුහගත පරීක්ෂණය :-* අදාල නැත.

03. තනතුරු නාමය :- ඖෂධ සංයෝජක III
බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව :- 01
වැටුප් පරිමාණය :- PL-2-2016(රා.ප.ච. 3/2016 අනුව)
(රු. 25,790-10x270-10x300-10x330-12x350- රු.38,990/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,034/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම (විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

පළපුරුද්ද :- රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබාතිබීම.

කායික සුදුසුකම් :- සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාතේ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ලිඛිත විභාගය :- අදාළ නැත

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:- අදාළ නැත

*ව්‍යුහගත පරීක්ෂණය :-*

- ව්‍යුහගත පරීක්ෂණයේ විෂයය නිර්දේශය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇත්තේ අ.පො.ස. පෙළ විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>* සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 04<br>* සම්මාන සාමාර්ථය - ලකුණු 06<br>* අධිසම්මාන සාමාර්ථය - ලකුණු 08<br>* විශිෂ්ඨ සම්මානය - ලකුණු 10 | 20 | 50% |
| දේශීය ඖෂධ හඳුනා ගැනීම, එහි ගුණාගුණ පිළිබඳ ඇති මූලික දැනුම විමසා බැලීම | 75 | |
| (පෞරුෂත්වය) සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලේ. | 5 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන*** :- *ලකුණු ලබාගැනීමේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකරනු අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බැලේ.*

04. තනතුරු නාමය :- රියදුරු III

බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)

පුරප්පාඩු සංඛ්‍යාව :- 02

වැටුප් පරිමාණය :- PL-3-2016(රා.ප.ච. 3/2016 අනුව)

( රු. 25,790-10x270-10x300-10x330-12x350- රු.38,990/-)

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,462/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනණක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් (6) ක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)

වෘත්තීය සුදුසුකම් :

*(අ)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

*(ආ)* පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන්රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බල පත්‍රයක් ලබාතිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

*(ඇ)* ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බල පත්‍රය (තාරබර හොන්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගින් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් A1 සහ C1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "B" සහ "D1" පන්තියේ බල පත්‍රයක් *නැතහොත්* තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

පළපුරුද්ද .- බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතිකයක් මගින් සහතික කළ යුතුය.)

කායික සුදුසුකම්.- අවම උස අඩි 05 ක් විය යුතුය. දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

*වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයඳුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.
V. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*වයස* :- වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

* 2017.11.11 දිනැති දිනමිණ පත්‍රයේ පල කරන ලද තනතුරු ඇබෑර්තු දැන්වීම සම්බන්ධයෙන් කැඳවන ලද අයදුම් පත්‍ර වලංගු වේ.

05. තනතුරු නාමය :- පුස්තකාල සහායක III

බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)

පුරප්පාඩු සංඛ්‍යාව :- 01

වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව)
(රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36,410/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් (6) ක් සමත් වී තිබීම. (මින් විෂයන් (05) ක් එකවර සමත් විය යුතුය.)

වෘත්තීය සුදුසුකම් :- අදාල නොවේ.
පළපුරුද්ද :- අදාල නොවේ.

කායික සුදුසුකම් :- සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාතේ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ලිඛිත විභාගය :- අදාළ නැත

ව්‍යුහගත පරීක්ෂණය :-

* ව්‍යුහගත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇත්තේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>• සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 04<br>• සම්මාන සාමාර්ථය - ලකුණු 06<br>• අධිසම්මාන සාමාර්ථය - ලකුණු 08<br>• විශිෂ්ට සම්මානය - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| (පෞරුෂත්වය) සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලේ. | 5 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන*** .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

* 2017.11.11 දිනැති දිනමිණ පත්‍රයේ පල කරන ලද තනතුරු ඇබෑර්තු දැන්වීම සම්බන්ධයෙන් කැඳවන ලද අයදුම් පත්‍ර වලංගු වේ.

06. තනතුරු නාමය :- ක්‍රීඩා භූමිභාරකරු III

බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)

පුරප්පාඩු සංඛ්‍යාව :- 01

වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව)

(රු. 24,250-10x250-10x270-10x300-12x330-රු.36,410/-)

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනණකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් (6) ක් සමත් වී තිබීම. මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බලනොපායි.

වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

පළපුරුද්ද :- අදාළ නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

* ව්‍යුහගත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇත්තේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>• සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 04<br>• සම්මාන සාමාර්ථය - ලකුණු 06<br>• අධිසම්මාන සාමාර්ථය - ලකුණු 08<br>• විශිෂ්ට සම්මානය - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| (පෞරුෂත්වය) සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලේ. | 5 | |
| මුළු ලකුණු | 100 | |

*සටහන* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

07. තනතුරු නාමය : කාර්යාල කාර්ය සහායක III
බඳවා ගැනීමේ ක්‍රමය : (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව : 03
වැටුප් පරිමාණය : PL-1-2016 (රා.ප.ච. 3/2016 අනුව)
(රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36,410/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් : යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් (6) ක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.
පළපුරුද්ද : අදාල නොවේ.

කායික සුදුසුකම් : තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :

* ව්‍යුහගත පරීක්ෂණයේ විෂ නිර්දේශය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇත්තේ අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>• සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 04<br>• සම්මාන සාමාර්ථය - ලකුණු 06<br>• අධිසම්මාන සාමාර්ථය - ලකුණු 08<br>• විශිෂ්ඨ සම්මානය - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| (පෞරුෂත්වය) සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලේ. | 5 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන* .-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

08. තනතුරු නාමය :- මුරකරු III
බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව :- 01
වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.එ. 3/2016 අනුව)
(රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනණකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් (6) ක් සමත් වී තිබීම. මින් විෂයයන් (05) ක් එකවර සමත් විය යුතුය.
වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.
පළපුරුද්ද :- අදාළ නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

* ව්‍යුහගත පරීක්ෂණයේ විෂයය නිර්දේශය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇත්තේ අ.පො.ස. සා.පෙළ විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන 02කට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 04<br>සම්මාන සාමාර්ථය - ලකුණු 06<br>අධිසම්මාන සාමාර්ථය - ලකුණු 08<br>විශිෂ්ඨ සම්මානය - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| (පෞරුෂත්වය) සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලේ. | 5 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන*** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

09. තනතුරු නාමය :- සෞඛ්‍ය කම්කරු III

බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)

පුරප්පාඩු සංඛ්‍යාව :- 14

වැටුප් පරිමාණය : - PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව)

(රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36,410/-)

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අටවන (08) වසර සමත් වී තිබිය යුතුය.)

වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

පළපුරුද්ද :- අදාළ නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

IV. වයස, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

| *ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය වසරකට (ලකුණු 05) බැගින් | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 5 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 5 | |

***සටහන*** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

10. තනතුරු නාමය :- මාර්ග කම්කරු III

බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)

පුරප්පාඩු සංඛ්‍යාව :- 03

වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.එ. 3/2016 අනුව)

(රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410/-)

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අටවන (08) වසර සමත් වී තිබිය යුතුය.)

වෘත්තීය සුදුසුකම් :- අදාල නොවේ.

පළපුරුද්ද :- අදාල නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

| *ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය වසරකට (ලකුණු 05) බැගින් | 15 | 50% |
| තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 5 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 5 | |

***සටහන*** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

11. තනතුරු නාමය :- ජල පොම්ප ක්‍රියාකරු III
බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව :- 01
වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව)
(රු 24,250-10x250-10x270-10x300-12x330-රු 36,410/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අටවන (08) වසර සමත් වී තිබිය යුතුය.

වෘත්තීය සුදුසුකම් :- අදාල නොවේ.

පළපුරුද්ද :- අදාල නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය වසරකට (ලකුණු 05) බැගින් | 15 | 50% |
| තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 5 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 5 | |

***සටහන*** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

12. තනතුරු නාමය :- විදුලි කම්කරු III
බඳවා ගැනීමේ ක්‍රමය :- (විවෘත)
පුරප්පාඩු සංඛ්‍යාව :- 02
වැටුප් පරිමාණය :- PL-1-2016(රා.ප.ච. 3/2016 අනුව)
(24,250-10x250-10x270-10x300-12x330-36410/-)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/- හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

අධ්‍යාපන සුදුසුකම් :- අටවන (08) වසර සමත් වී තිබිය යුතුය.

වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

පළපුරුද්ද :- අදාළ නොවේ.

කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්පත් කැඳවන විට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. වයස අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
VI. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :-

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය වසරකට (ලකුණු 05) බැගින් | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 5 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 5 | |

***සටහන*** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

13. *බඳවා ගැනීමේ ක්‍රමය* :

I. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම් සිදු කරනු ඇත.

14. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු, ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.

iv. ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

v. මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ කටුනායක සීදූව නගර සභාවේ ලේකම් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

15. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව, අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්පත සමග, ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් 'ලේකම්' කටුනායක සීදූව නගර සභාව නමට ලබා ගන්නා ලද සහ ගෙවීම් කාර්යාලය සීදූව ලෙස සඳහන් කරන ලද රු. 1000.00 ක සාමාන්‍ය මුදල් ඇණවුමක මුල් පිටපත අයදුම්පතෙහි අදාළ ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. (ඔබගේ අවශ්‍යතාවය සඳහා මුදල් ඇණවුමෙහි පිටපතක් ඔබ සතුව තබා ගැනීම සුදුසුය.)

iii. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර "ආ සිට ඌ" දක්වා වන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.

(අ) ඔබගේ නම සහ ලිපිනය ලියන ලද 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක්,
(ආ) උප්පැන්න සහතිකය,
(ඇ) අධ්‍යාපන සහතික හෝ ලබා ගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික,
(ඈ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,
(ඉ) පළපුරුද්ද පිළිබඳ සහතික,
(ඊ) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
(උ) රියදුරන් සඳහා තමන්ගේ ස්ථිර පදිංචි කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාවක් (අයදුම් පත භාර ගන්නා අවසාන දිනට මාස 06 කට නො අඩු විය යුතුය.)
(ඌ) චරිත සහතිකයක්

iv. යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේනම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.

v. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.10.26 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, කටුනායක සීදූව නගර සභාව, සීදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
කටුනායක සීදූව නගර සභාව.

2018 සැප්තැම්බර් මස 22 වැනි දින.

කටුනායක සීදූව නගර සභාව

........................................................................ *තනතුර සඳහා ඉල්ලුම් කිරීම*

1. (අ) මුලකුරු සමග නම :.........................................................................
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :..........................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3. (අ) ස්ථිර පදිංචි ලිපිනය :...........................................................
දුරකතන අංකය :..........................................................

4. (ආ) කාර්යාලීය ලිපිනය :...........................................................
දුරකතන අංකය :..........................................................

5 (අ) උපන් දිනය :..........................................................

6 (ආ) ........................... දිනට වයසය :
අවුරුදු :............... මාස :............... දින:...............

7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...........................................................

8. විවාහක/අවිවාහක බව :...........................................................

9. ස්ත්‍රී/පුරුෂභාවය :..........................................................

10. අධ්‍යාපන සුදුසුකම්.

අ.පො.ස.(ස.පෙළ) විභාගය :

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස.(උ.පෙළ) විභාගය :

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :...............................................................................
...............................................................................................................
...............................................................................................................

12. ඉහත තොරතුරු සනාථ කිරීමට අදාළ පහත ලිපි ලේඛණ ඉදිරිපත් කර ඇති බව සනාථ කිරීම.
(අදාළ කොටුව තුළ හරි හෝ වැරදි ලකුණ යොදන්න.)

| | | |
|---|---|---|
| A. | නම ලිපිනය ලියන ලද 9x4 ප්‍රමාණයේ ලියුම් කවරය | |
| B. | උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක් | |
| C. | අධ්‍යාපන සහතික හෝ ලබා ගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතිකවල සහතික කළ ඡායා පිටපත්. | |
| D. | පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කළ ඡායා පිටපත් | |
| E. | ජාතික හැඳුනුම්පතේ දෙපැත්තේ සහතික කළ ඡායා පිටපතක් | |

13. මුදල් ඇණවුමේ මුල් පිටපත මෙහි අලවන්න.

මුදල් ඇණවුමේ මුල් පිටපත

A. මුදල් ඇණවුමේ අංකය :..............................
B. මුදල් ඇණවුම ලබාගත් දිනය :..............................
C. ගෙවන ලද මුදල :..............................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවයකර තිබේද, එසේ නම් විස්තර :..........................................................
..........................................................................................................................
..........................................................................................................................

මවිසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව මම දනිමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

මෙම ආයතනයේ ............................................................. තනතුර දරන ..................................................................... මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම/හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳ කටයුතු සකස් කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

..............................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව).

දිනය :.....................

10 - 269

# පළාත් පාලන නිවේදන

## හම්බන්තොට මහා නගර සභාව

2019 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය

හම්බන්තොට මහා නගර සභාවේ 2019 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වන දින සිට 2018 ඔක්තෝබර් මස 29 වන දින දක්වා (රජයේ නිවාඩු දින සහ ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේදී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 212 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
මහා නගර සභාව, හම්බන්තොට.

2018 සැප්තැම්බර් මස 24 වන දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

10- 202

---

## තංගල්ල නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 55 ''අ'' වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරයේ) 55 ''අ'' වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තංගල්ල නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර ''නිසල උයන මාවත'' නමින් නම් කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රවිඳු වෙදආරච්චි,
සභාපති,
තංගල්ල නගර සභාව,

2018 අගෝස්තු මස 07 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. පළාත් පාලන ආයතනයේ නමඃ තංගල්ල නගර සභාව
02. දිස්ත්‍රික්කය ඃ හම්බන්තොට
03. මාර්ගයේ වර්තමාන නමඃ සුසාන භූමිය පාර
04. අලුතින් යොදා ඇති නමඃ නිසල උයන මාවත
05. මාර්ග විස්තරයඃ හම්බන්තොට පාර සිට විජ්ජතොට වත්ත අසලින් අවසන් වන මාර්ගය වේ.

10 - 19

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2017.09.13 දින ලේකම් තීරණය මත 1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනත හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවෙන 198 වගන්තිය ප්‍රකාරව 2018.06.12 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති මාළිගාවත්ත කුරුපැත්ත මාර්ගයෙන් හැරෙන මාර්ගය සඳහා "රාජසිංහ මාවත" නම භාවිතා කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

10-56

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් තීරණය ගන්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති.
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 09 වැනි දින.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන ) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා)පනතේ (2) වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්ද වූ පහත සඳහන් කොට ඇති අතුරු ව්‍යවස්ථා

01. පල්ලේපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව.
02. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සේවා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
03. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
04. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
05. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව.
06. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බදු අය කර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව.
07. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී, ව්‍යාපාර,අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
08. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
09. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

10. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරුවස්ථාව.
11. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව.
12. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
13. පල්ලෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සත්ත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව.
14. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
15. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
16. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික ඉගැන්නුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
17. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහන වල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත් ඊට පෙර දින මධ්‍යම රාත්‍රී 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුනු අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 13 වැනි දින තීරණ අංක 05.09 යටතේ මෙයින් තීරණය කරමි.

10 - 78

---

## හික්කඩුව නගර සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු , 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1878 හා 2014.08.29 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුළ සියලු සම්මත අතුරු ව්‍යවස්ථා වලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළවම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, සහා රැස්වීම් කරගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල් බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරිපට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිනුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපනශාලා සහ තේ සහ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනා ගමනයට බාධා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ආදාහනාගාර විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හා ගාස්තු අයකිරීම, වෙළෙඳ පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට අදාළ විධිවිධාන හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 2018.06.19 වැනි දින තීරණ අංක ඒ (06) යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

විනී කාරියවසම්
සභාපති,
හික්කඩුව නගර සභාව.

2018 අගෝස්තු මස 14 වැනි දින,
හික්කඩුව නගර සභා කාර්යාලයේ දීය.

10-134

# විවිධ දැන්වීම්

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 152(1) වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 23 පරිදි පහත සඳහන් ව්‍යාපාර බදු පැනවීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**ඉහත කී තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පදියතලාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාර යේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකය සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකල යුතු යැයි ද, සහ

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ, (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2019.03.31 දිනට ප්‍රථම පදියතලාව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද තීරණය කරමි.

**ඉහත කී උපලේඛනය**

| | I වන තීරුව<br>2017 වර්ෂයේ දී ආදායම | II තීරුව<br>රු. ශ. |
|---|---|---|
| I. | රු. 6,000.00 නොඉක්මවන වන අවස්ථාවක | කිසිවක් නොමැත |
| II. | රු. 6,000.00 ඉක්මවන එහෙත් රු.12,000.00 නොඉක්ම වන අවස්ථාවක | 90.00 |
| III. | රු. 12,000.00 ඉක්මවන එහෙත් රු.18,750.00 නොඉක්ම වන අවස්ථාවක | 180.00 |
| IV. | රු. 18,750.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොඉක්ම වන අවස්ථාවක | 360.00 |
| V. | රු. 75,000.00 ඉක්මවන එහෙත් රු.1,50,000.00 නොඉක්ම වන අවස්ථාවක | 1,200.00 |
| VI. | රු. 1,50,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

**බදු සඳහා ආදාළ වන ව්‍යාපාර**

01. ග්‍රෝස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කර තැබීම.
02. උළු විකිණීමේ හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
03. රථවාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
04. විදුලි උපකරණ, ගුවන් විදුලි, කැසට්, රූපවාහිනී යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
05. පා පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
06. පාවහන් හා බෑග් වර්ග වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
07. මහන මැෂින් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
08. පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
09. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

10. රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11. ලියාපදිංචි කල පෞද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම.
12. නාන කාමර කට්ටල් හෝ සෙරමික් නිෂ්පාදන භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
13. පුවත්පත්, ලිපි ද්‍රව්‍ය, පාසැල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14 වතුර පොම්ප විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
15. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම.
16 සැලසුම් නිර්මාණ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පරිගණක හෝ යතුරු ලියන පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. ජෝතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක හෝ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම.
20. ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. දැව හෝ වානේ ගෘහ භාණ්ඩ/ දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. රජය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. කාය වර්ධන මධ්‍යස්ථාන.
24. පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි දැන්වීම් භාර ගැනීමේ හා රූපවාහිනී, ගුවන්විදුලි වැඩ සටහන් සෑදීම.
25. ක්‍රීඩා භාණ්ඩ අලෙවිය.
26. වෙන්දේසිකරුවන්.
27. බ්‍රෝකර්වරුන් .
28. රක්ෂණ ආයතන.
29. බැංකු කටයුතු හා මූල්‍ය ආයතන.
30. ෆිනෑන්ස් ආයතන.
31. කොන්ත්‍රාත්කරුවන්.
32. විදේශ රැකියා ආයතන.
33. තුරඟ තරග ඔට්ටු භාර ගැනීමේ නියෝජිත.
34. සිගරට් වෙළෙඳ නියෝජිත
35. පුද්ගලික සාත්තු නිවාස
36. දුරකතන අලෙවි සැලක්
37. පෞද්ගලික විගණකාධිකාරි ආයතනයක්
38. අපනයන හා ආනයන ඒජන්තවරු
39. නීතිඥවරුන්
40. වෛද්‍යවරුන්
41. සැපයුම්කරුවන්
42. ප්‍රවාහන නියෝජිතවරුන්
43. දෘෂ්ටි පරීක්ෂකයින් හා ඇස්කණ්නාඩි අලෙවිය
44. ආහාරපාන සපයන්නෝ
45. බලවේග පේෂකර්මාන්ත
46. බතික් කර්මාන්ත
47. බලයලත් උකස් ආයතන
48. බලපත්‍රලාභී මත්පැන්හල්
49. මෝටර් රථ වාහන වෙළොඳාම් කරන්නන්.
50. රියැදුරු පුහුණු කරන ආයතන.
51. යතුරු පැදි, අත්ට්‍රැක්ටර් හා ත්‍රී රෝද රථ වෙළෙඳාම් කරන්නන්
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ආයතන
53. පෞද්ගලික අධ්‍යාපන ආයතන හා ළදරු පාසල් පවත්වාගෙන යන්නන්.
54. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ඇඟළුම් කර්මාන්ත ශාලා හිමියන් .
55. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කල යම් හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පලක් පවත්වාගෙන යන්නන්.
56. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථාන.
57. දත් බඳින ස්ථාන.
58. වැලි ගොඩ දැමීම හා ප්‍රවාහණය

10 - 45/1

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 150(1) වගන්තිය අනුව පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 24 පරිදි පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ඉහත කී තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පදියතලාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්ගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කල යුතු ද යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ, (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද තීරණය කරමි.

| I වැනි තීරුව<br>කර්මාන්ත | II වැනි තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|
| | රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| | රු. ශ. | රු. ශ | රු. ශ |
| 01. යන්ත්‍ර මගින් කළුගල් කැඩීම, පිපිරවීම හා විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |
| 03. උළු මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04. මිරිස් මෝලක්, කුළු බඩු පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05. වීමෝලක් පවත්වාගෙන යාම (කමත් රහිත) | 500.00 | 750.00 | 1,000.00 |
| 06. වී මෝලක් පවත්වාගෙන යාම (කමත් සහිත) | 500.00 | 750.00 | 1,000.00 |
| 07. වී මෝලක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණය) | 500.00 | 750.00 | 1,000.00 |
| 08. වීමෝලක් පවත්වාගෙන යාම (කුඩා ප්‍රමාණය) | 500.00 | 750.00 | 1,000.00 |
| 09. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. කොන්ක්‍රීට් නිෂ්පාදන (සිමෙන්ති ගල් ඇතුළුව) කරන ස්ථානයක් | 500.00 | 750.00 | 1,000.00 |
| 11. ඇළුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. අයිස් ක්‍රීම්, සිසිල් බීම නිෂ්පාදන කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17. ගඩොල් නිෂ්පාදන | 500.00 | 750.00 | 1,000.00 |

10-45/2

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සහ 149 වැනි වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 147(1) ''ආ'' වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 25 පරිදි පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කිරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ඉහත කී තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යක් සඳහා පදියතලාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය සහා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධ යෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කල යුතු යැයි තීරණය කරමි.

| *I වැනි තීරුව*<br>*බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ* |
| 01. බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 02. ලැගුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 03. හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 04. රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 05. කිරිගව පට්ටියක්, එළගව, ඌරන්, සුරතල් මසුන් ආදී සත්තු ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 06. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 07. ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 08. සිසිල් බීම, අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 09. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 10. ගැළුම් 50 ට වැඩි පොල්තෙල් ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 11. ගැළුම් 10 ට වැඩි එළවළු තෙල් ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 12. ග්‍රොස් 10 ට වැඩි ගිණිපෙට්ටි ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 13. අතින් ලී ඉරන ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 14. ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 15. මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම (ගරාජ්) | 500 0 | 750 0 | 1000 0 |
| 16. බයිසිකල්, මෝටර් බයිසිකල්, ත්‍රී වීල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 17. අම්ලකර වායුව පාවිච්චි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 18. බැටරි චාර්ජ් කිරීමේ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |

| *I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ* |
| 19. වයින්ස්ප්‍රීතු, මෙතිලේටඩ් විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 20. අයිස් ක්‍රීම්, යෝගට්, බීම පැකට්, ශීත කල බීම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 21. ශීතකරනවල තබා මස් වර්ග විකිණීම | 500 0 | 750 0 | 1000 0 |
| 22. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 23. වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 24. ඉන්දන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 25. ගිනි කෙලි, රතිඤ්ඤා වැනි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 26. නිෂ්පාදන කරන ලද ලී බඩු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 27. මාළු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 28. මාස් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 29. හුණු අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 30. කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 31. සුපිරි වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 32. සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම | | | |
| 33. ඕනෑම වර්ගයක ජංගම වෙළඳ රථයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 34. එළවළු, පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 35. ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 36. කිරි එකතු කරන හා විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 37. ක්ෂණික ආහාර විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 38. සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 39. පානීය ජල බෝතල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 40. කරවල විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 41. ඔසුපැන්, කොළ කැඳ, කඩල, රටකජු, ටේස්ට් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 42. හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 43. පත්තර, සඟරා, පොත්පත්, ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 44. බුලත්, පුවක් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 45. කොමියුනිකේෂන්, (දුරකථන) ඡායා පිටපත් යන්ත්‍ර, අන්තර්ජාල පහසුකම්, රොනියෝ කිරීම, ලැමිනේට් කිරීම, යතුරු ලියනය කිරීම ආදී ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 46. නිමි ඇඳුම් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 47. උත්සව භාණ්ඩ කුලියට දීමේ (හට්, තහඩු ආදිය) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 48. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 49. ෆාමසි, රසායනාගාර ආදී ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 50. DVD, VCD කුලියට දීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 51. දැන්වීම් හා නාමපුවරු, ස්ටිකර් කැපීම, අකුරු ඇලවීම, අංක තහඩු කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 52. මිනී පෙට්ටි සාප්පු, මරණාධාර සේවාවන්, මංගල අවමංගල සේවාවන් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 53. මුද්‍රණාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |

| *I වැනි තීරුව කර්මාන්ත* | *II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ* |
| 54. ටයර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 55. තීන්ත වර්ග අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 56. රබර් ලාංඡන සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 57. සමූපකාර සංගම් (කෝප්සිටියක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 58. විදුලි උපකරණ අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 59. ලොතරැයි අලෙවි කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 60. පෝසිලේන්, සිල්වර් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 61. තරාදි, කිරුම් මිනුම් උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 62. පරණ යකඩ, හිස් බෝතල්, පරණ ප්ලාස්ටික්, පත්තර ආදිය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 63. සංගීත භාණ්ඩ කුලියට දීම හෝ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 64. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 65. විසිතුරු පැල, පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 66. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 67. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 68. රස කැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1000 0 |
| 69. විසිතුරු සතුන් විකිණීම | 500 0 | 750 0 | 1000 0 |
| 70. ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 71. කුකුළන් ඇති කරන කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |

10 - 45/3

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 26 පරිදි පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ඉහත කී තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙක් ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කල යුතු යැයි ද, සහ

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ, (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද තීරණය කරමි.

**උපලේඛනය**

| | I වන තීරුව | II වන තීරුව<br>රු. ශත |
|---|---|---|
| i. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| ii. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | (අ) වෙළෙඳ කාර්යන් සඳහා යොදවන්නේ නම් | 25 0 |
| | (ආ) වෙළෙඳ කාර්ය සඳහා නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 25 0 |
| iii. | සෑම කරත්තයක් සඳහා | . 50 0 |
| iv. | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| v. | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| vi. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| vii. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

3. මේ උප ලේඛනයෙහි වෙළඳ කාර්ය, විකිණීම, සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත් වේ.

10 - 45/4

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට සති පොළ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 119 වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 27 පරිදි පහත සඳහන් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**ඉහත කී තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය අනුව, (1) වන උප වගන්තිය අනුව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සති පොළෙහි ගාස්තු අය කිරීම සභාව විසින් ඍජුව වෙළඳ අයිතිය බදු දීමේ බදුකරු විසින් 2019 වර්ෂය වෙනුවෙන් ගාස්තු අය කිරීමට හා, ප්‍රධාන පාර දෙපස වෙළඳාම් කිරීම තහනම් බවත්, අළුතින් සකස් කර ඇති පොළ භූමියේ පමණක් වෙළඳාම් කිරීම කරන බවටත්, එකඟතාවය ඇතිව පොළ බදු දීමටත්, එම සීමාව තුල පොළ භූමියට ගෙන එනු ලබන කිසිදු තොගයක්, භාණ්ඩයක් පොළ භූමියෙන් පිටත මිලදී ගැනීමක්, විකිණීමක් නීත්‍යානුකූල නොවන බවටත්, කිසිදු විටක මාර්ග අවහිර වන ආකාරයට වාහන ගාල් කර නොතබන ලෙසටත්, 2018.07.18 දින ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සති පොළෙහි වෙළඳුන්ගෙන් අය කල හැකි උපරිම ගාස්තු

| | | |
|---|---|---|
| 1. | විවෘත කඩ (භූමියේ වර්ග අඩි 01) | රු. 5.00 |
| 2. | වෙළඳ පාපැදියක් සඳහා | රු. 100.00 |
| 3. | වෙළඳ යතුරුපැදියක් සඳහා | රු. 250.00 |
| 4. | වෙළඳ අත්ට්‍රැක්ටරයක් සඳහා | රු. 500.00 |
| 5. | වෙළඳ ලොරියක් සඳහා | රු. 750.00 |
| 6. | වෙළඳ වෑන් රථයක් සඳහා | රු. 750.00 |
| 7. | මාළු ලෑල්ලක් සඳහා (ලොරි සහ වෑන්) | රු. 750.00 |

10 - 45/5

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### පදියතලාව ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම පිළිබඳ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් සභාවේ ලේකම්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභාව සතු පහත දක්වෙන වාහන හා යන්ත්‍රෝපකරණ පහත දක්වෙන මිළ ගණන් යටතේ කුලියට දීමටද, ඒ තුලින් සභා අරමුදලට යම් දායකත්වයක් ලබා දීමටත්, 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 28 යටතේ තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | JCB යන්ත්‍රය කුලියට දීම | පැයකට රු. 3000.00 |
| 2. | ජල බවුසරය කුලියට දීම (බවුසරය පමණක්) | පැයකට රු. 500.00 |
| 3. | ට්‍රැක්ටරය ට්‍රේලරය සමග කුලියට දීම | පැයකට රු. 4000.00 |
| 4. | රෝලර් යන්ත්‍රය කුලියට දීම | පැයකට රු. 3000.00 |
| 5. | ට්‍රැක්ටර් රථය බවුසරය සමග ජල සේවාව වෙනුවෙන් කි.මී.01කට (ජලය සභාව මඟින් සපයන්නේ නැත) | රු.100.00 |

6. කෲ කැබ් රථය කුලියට දීම - දිනකට රු. 5000.00 ක් හෝ කි.මී. 01 කට රු. 50.00 ක් යන දෙකෙන් වැඩි අගය මත.
7. ටිපර් රථය කුලියට දීම - දිනකට රු. 7500.00 ක් හෝ කි.මී. 01 කට රු. 75.00 ක් යන දෙකෙන් වැඩි අගය මත.

10 - 45/6

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ජල නල එලීම් වලදී මාර්ගය පළුදු කිරීම සම්බන්ධ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රාදේශීය සභාව මඟින් ඉදිකල හා නඩත්තු කරනු ලබන මාර්ග වල ජල නල එලීම් කටයුතු සඳහා පළුදු කිරීම් වලදී පහත දැක්වෙන ගාස්තු අය කිරීමට කටයුතු කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 9 (3) වගන්තිය ප්‍රකාරව සභාවේ ලේකම්වරයා වෙත පැවරී ඇති බලතල අනුව 2019.01.01 දින සිට පනවා අය කිරීමට 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 29 යටතේ තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

1. 1M x 1M වලක් කැනීමේ දී — රු. 1250.00
2. අවම දිග මීටර් 01 ක නල එලීමක දී,
   - a මාර්ගය පළුදු කිරීම් වලදී තාර යෙදූ මාර්ග — රු. 1250.00
   - b මාර්ගය පළුදු කිරීම් වලදී කොන්ක්‍රීට් යෙදූ මාර්ග රු. 2500.00
3. වැඩිවන සෑම මීටර් 01 කට අය කිරීම
   - a තාර යෙදූ මාර්ග — රු. 500.00
   - b කොන්ක්‍රීට් යෙදූ මාර්ග — රු. 750.00

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

10 - 45/7

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට දැන්වීම් ප්‍රදර්ශණය කිරීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය යටතේ පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 30 යටතේ පහත සඳහන් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**ඉහත කී තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකර ඇති සිව්වන අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර පදියතලාව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු අතර, ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2019 වසර සඳහා පනවා 2019.01.01 දින සිට අය කිරීමට තීරණය කරන ලද බව දන්වමි.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා | |
| | වර්ග අඩි 01කට අවුරුද්දකට | රු. 100.00 |
| 2. | ප්‍රචාරක දැන්වීමක් (බැනර්) ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් එක් දැන්වීමකට | |
| | වර්ග අඩි 01 කට වැඩිමුත් දින7 ක් නොඉක්මවන විට | රු. 150.00 |
| | දින 07 සිට දින 14 දක්වා වර්ග අඩි 01 කට | රු. 200.00 |
| | දින 14 සිට දින 30 දක්වා වර්ග අඩි 01 කට | රු. 300.00 |
| | දින 30 සිට මාස 06 දක්වා වර්ග අඩි 01 කට | රු. 400.00 |
| | මාස 06 ක් ඉක්මවන විට වර්ග අඩි 01 කට | රු. 500.00 |
| 3. | ස්ථිර දැන්වීම් පුවරු | |
| | විනිවිධ පෙනෙන/ විදුලි ආලෝකනය කරන ලද වර්ග අඩියකට | රු. 250.00 |
| | විනිවිධ පෙනෙන/ විදුලි ආලෝකනය නොකරන ලද වර්ග අඩියකට | රු. 200.00 |
| | ඉටි රෙදි හෝ රෙදි මගින් කරන ලද දැන්වීම් සඳහා | |
| | වානිජ දැන්වීම් සඳහා වර්ග අඩියකට | රු. 150.00 |
| | වෙනත් විවිධ සුභසාධන කටයුතු සඳහා වර්ග අඩියකට | රු. 100.00 |

10 - 45/8

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන පළාත් සභා අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස් ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව (260 වන අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 31 පරිදි පහත සඳහන් තීරණ ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ඉහත කී තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පදියතලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් සභා අති විශේෂ *ගැසට් පත්‍රයේ* යේ IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව (260 වන අධිකාරිය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.01.01 වැනි දින සිට පදියතලාව ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු මෙම සභාව වෙත අය කිරීමට 2018.07.18 දින ගන්නා ලද මාගේ තීරණය මෙයින් නිවේදනය කරමි.

### උපලේඛනය I

ගොඩනැගිලි ඉදිකිරීම

| | *වර්ග අඩි* | *පදිංචිය සඳහා රු. ශත.* | *වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා රු. ශත.* |
|---|---|---|---|
| 1. | 750 හෝ ඊට අඩු | 500.00 | 750.00 |
| 2. | 751 හෝ 1000 දක්වා | 750.00 | 1,000.00 |
| 3. | 1001 හෝ 1100 දක්වා | 1,000.00 | 1,250.00 |
| 4. | 1101 හෝ 1500 දක්වා | 1,250.00 | 1,750.00 |
| 5. | 1501 හෝ 2000 දක්වා | 1,500.00 | 2250.00 |
| 6. | 2001 හෝ 2500 දක්වා | 2,000.00 | 2,750.00 |
| 7. | 2501 හෝ 3000 දක්වා | 2,500.00 | 3,500.00 |
| 8. | 3001 හෝ 3500 දක්වා | 3,000.00 | 4,250.00 |
| 9. | 3501 හෝ 4000 දක්වා | 4,000.00 | 5,000.00 |

| | වර්ග අඩි | පදිංචිය සඳහා<br>රු. ශත. | වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා<br>රු. ශත. |
|---|---|---|---|
| 10. | 4001 හෝ 5000 දක්වා | 5,000.00 | 6,500.00 |
| 11. | 5001 හෝ 6000 දක්වා | 6,000.00 | 8,000.00 |
| 12. | 6001 හෝ 8000 දක්වා | 8,000.00 | 10,000.00 |
| 13. | 8001 හෝ 10000 දක්වා | 10,000.00 | 20,000.00 |
| 14. | 10000 ට වැඩි සෑම වර්ග අඩි 01 ක් සඳහා | 40.00 | 100.00 |

10 - 45/9

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### සභාව සතු ක්‍රීඩාභූමි බදු දීමේදී ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

සභා සීමාව තුළ පෞද්ගලික ඉඩමක හෝ විනෝද සංදර්ශන, ක්‍රීඩා සංදර්ශන, සංගීත සංදර්ශන ආදිය ප්‍රදර්ශනය කිරීමේ දී ගාස්තු අය කිරීම

මෙහි පහත දැක්වෙන ගාස්තු 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 32 අනුව නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### උපලේඛනය

සභාව සතු දේපල සම්බන්ධයෙන්

| | | රු. ශත |
|---|---|---|
| * | පොළ භූමිය සංදර්ශන සඳහා දිනකට බදු දීම | 1,000.00 |
| * | ආපසු ගෙවන ඇප | 3,500.00 |
| * | ආපසු නොගෙවන ඇප | 1,000.00 |
| * | සුභ සාධක කටයුතු සඳහා | 200.00 |

සභා සීමාව තුළ පෞද්ගලික ඉඩම් තුල පවත්වන සංදර්ශන සඳහා

| | | |
|---|---|---|
| * | ඕනෑම සංදර්ශනයක් සඳහා දිනකට | 500.00 |

10 - 45/10

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ඉඩම් අනු බෙදීම/ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම

නාගරික සංවර්ධන ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009.04.16 වැනි දින කොළඹ දී රජයේ නිවේදන එල්. ඩී. බී. 16/78 යටතේ ප්‍රකාශයට ගත් කරන ලද අංක 1597/8 හා 2009 අප්‍රේල් මස 17 වැනි දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* පස්වෙනි (V) උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂයට බලපාන පරිදි පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පනවා 2019.01.01 සිට අය කිරීමට 2018 ජූලි මස 18 වැනි දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 33 වන තීරණය පරිදි නිවේදනය කරනු ලැබේ.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු ඃ

| | | |
|---|---|---|
| (i) | ව්‍යාපාරික ස්ථානයක් සඳහා | රු. 400.00 |
| (ii) | පදිංචි ස්ථාන සඳහා | රු. 350.00 |
| (iii) | ඉඩම් අනු බෙදුම සඳහා | |
| | නේවාසික | රු. 350.00 |
| | ව්‍යාපාරික (වෙන්දේසි) | රු. 500.00 |
| 02. | ගොඩනැගිලි අයදුම්පත්‍ර සම්බන්ධ සහතික පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | රු. 300.00 |
| 03. | අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කාලය දීර්ඝ කිරීම | |
| | පළමු අවුරුද්ද සඳහා | රු. 200.00 |
| | දෙවන අවුරුද්ද සඳහා | රු. 250.00 |
| | තෙවන අවුරුද්ද සඳහා | රු. 300.00 |

උපරිම කාලය වසර 03කි. අවුරුදු 03කට පසු සැලැස්ම අළුත් කරගත යුතුවේ.

10 - 45/11

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### පුස්තකාල සේවාවන් මත ගාස්තු අයකිරීම

2018.07.18 දිනැති ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 38 යටතේ පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

| | | |
|---|---|---|
| 1. | සාමාජික අයදුම්පතක් (වර්ෂයකට) | රු. 25.00 |
| 2. | එක් අයකුගේ ඇප තැන්පත් වර්ෂයකට | රු. 75.00 |
| 3. | ප්‍රමාද ගාස්තු දිනකට | රු. 01.00 |
| 4. | පොතක් අස්ථාන ගත වූ විට පොතේ වටිනාකම හා ඊට අමතරව පොතේ වටිනාකමින් 30% ක් අය කරනු ලැබේ. | |

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

10 - 45/12

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුප්‍රාප්තිකයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීම මත ලද මුදලින් 1% ක බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජක විසින් පදියතලාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට නියම කිරීමට 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 34 වන තීරණය මත බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 154(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වැනි දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

10 - 45/13

## පදියතලාව ප්‍රාදේශීය සභාව

## සුසාන භූමි ආඥාපනත 231 අධිකාරිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වන වැනි වගන්තිය හා සුසාන භූමි ආඥාපනත 03 වගන්තිය හා 17 සිට 22 වගන්ති අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මතු දැක්වෙන උප ලේඛනයේ සඳහන් සුසාන භූමි වල භූම දාන කිරීමක්, ආදාහන කිරීමක්, තැන්පත් කිරීමක් හා ස්මාරකයක් ඉදිකිරීමක් සඳහා පහත සඳහන් ගාස්තු 2018.07.18 දින, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක 35 යටතේ තීරණය කළ බව මින් මහජනයාගේ දැන ගැනීම සඳහා නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

### සුසාන භූමි පිළිබඳ උපලේඛනය

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම | සොහොන් භූමි පිහිටි ස්ථාන (අක්කර 02 බැගින්) | | |
|---|---|---|---|---|
| | | 01 | 02 | 03 |
| 01 | සේරංකඩ | සේරංකඩ | - | - |
| 02 | මොරදෙණිය | මොරදෙණිය | කොළානේයාය | - |
| 03 | පළතුරුවැල්ල | පලතුරුවැල්ල (ප්‍රධාන මාර්ගය අසල) | - | - |
| 04 | පුළුන්ගස්මුල්ල | පුළුන්ගස්මුල්ල | - | - |
| 05 | හෝලිකේ | හෝලිකේ වේකුරුල්ල | හතුකුඹුර | වලබැද්ද |
| 06 | මිරිස්වත්ත | කෙම්මලපිටිය | කෙසෙල්පැලේබැද්ද | |
| 07 | කොළමන්තලාව | කොළමන්තලාව | - | - |
| 08 | දොරකුඹුර | දොරකුඹුර | වහව | - |
| 09 | මරංගල | මරංගල | කීනාතුමුල්ල | - |
| 10 | කෝමාණ | කෝමාණ | හෙලකෝමාණ | මාරාව |
| 11 | කෙහෙල්උල්ල | 51 කණුව | බෝගරාව | |
| 12 | පදියතලාව | 56 කණුව | - | - |
| 13 | තලාපිටඔය දකුණ | කොකුමාවර | - | - |
| 14 | කිරවාන | වැලිකුඹුර | ඇහැලඅතුමුල්ල | දංගමුව |
| 15 | තලාපිටඔය වම | හෝලිකේ පාර | කැලේලිදවතුයාය | - |
| 16 | පල්ලේගම | පල්ලේගම | පදවල | - |

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම | සොහොන් භූමි පිහිටි ස්ථාන (අක්කර 02 බැගින්) | | |
|---|---|---|---|---|
| | | 01 | 02 | 03 |
| 17 | ගල්ඕඩේ | ළිඳගල | උණගස්ලන්ද | - |
| 18 | උනාපාන | නාවින්න | - | - |
| 19 | හාගම්වෙල | කුඹුරුවෙල | මාවුන්නවෙල | - |
| 20 | සරණගම | ප්‍රජා ශාලාව අසල | තපස්සිරියාය | - |

ගාස්තු පිළිබඳ විස්තර :

වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් සඳහා ගාස්තුව - රු. 3500.00
ස්මාරකයක් ඉදිකිරීම වර්ග අඩි එකකට රු. 500.00 බැගින් (උපරිම වර්ග අඩි 10)

* තවද භූමදාන කටයුතු ඉටු කිරීමේ දී ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 30 ක් ද අතුරු මාර්ගයේ සිට මීටර් 10 ක් පසු පසට භූමදාන කටයුතු සිදුකල යුතුය.

* තැන්පත් කිරීම් වලදී මීටර් 30 ක් සුසාන භූමි ඉඩම හා මාර්ගය අතර දුර ප්‍රමාණයක සිට තැන්පත් කිරීම් කල යුතු අතර ස්මාරක ඉදිකිරීමේ දී එකී දුර ප්‍රමාණයේ සිට කළ යුතු වේ. ප්‍රාදේශීය සභාව මගින් පෙන්වා දෙනු ලබන ස්ථානයේ තැන්පත් කිරීම් සිදු කල යුතුය.

* සුසාන භූමියට අක්කර 02 ක භූමි භාගයක් ඇති හෙයින් හැකිතරම් ඉඩමේ පසු පසට වන්නට තැන්පත් කිරීම් කළ යුතු අතර භූමිය සීමිත හෙයින් උපරිම ප්‍රයෝජන ගැනීමට වග බලා ගත යුතු වේ.

10 - 45/14

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

## 2019 වර්ෂයට කුලී රථ ලියාපදිංචි කිරීම හා අවසරපත් ගාස්තු පැනවීම

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පදියතලාව නගරය, සේරංකඩ නගරය, ගල්ඕඩේ නගර වල ගාල් කර ඇති ත්‍රී රෝද රථ, ඩීමෝ බට්ටා ලොරි, ට්‍රැක්ටර් හා භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ පටවන හා භාණ්ඩ බහාලන ලොරි රථ, මගී බස් රථවලින් රථ වාහන ගාස්තුවක් පහත උප ලේඛනයේ පරිදි අය කිරීමට,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය මගින් පදියතලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.07.18 දින තීරණ අංක 36 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

| | | |
|---|---|---|
| 1. | ප්‍රාදේශීය සභාවේ ලොරි රථ ගාල්වල ලොරි රථ ලියාපදිංචිය සඳහා | වාර්ෂිකව රු. 2000.00 |
| 2. | ප්‍රාදේශීය සභාවේ ත්‍රී රෝද රථ ගාල්වල ත්‍රී රෝද රථ ලියාපදිංචිය සඳහා | වාර්ෂිකව රු. 1250.00 |
| 3. | ටේලරය සහිත ට්‍රැක්ටරය සඳහා | වාර්ෂිකව රු. 1000.00 |
| 4. | භාණ්ඩ පැටවීම හා බෑම කරනු ලබන ලොරි රථ සඳහා | රු. 50.00 |
| 5. | පාපැදි ලියාපදිංචිය සඳහා වාර්ෂිකව | රු. 25.00 |
| 6. | නගරයේ ආපන ශාලා අසල නතර කරනු ලබන මගී ප්‍රවාහන බස් රථ සඳහා ආපන ශාලා හිමියන්ගෙන් එක් බස් රථයකට | දිනකට රු. 35.00 |
| 7. | සභාවේ මාර්ග භාවිතා කරනු ලබන පෞද්ගලික බස් රථ වලින් | වාර්ෂිකව රු. 1000.00 |
| 8. | නගරයේ නතර කරනු ලබන වෑන් රථ, බස් රථ හා වෙනත් වාහන (සංචාරක හෝ වෙනත්) | රු. 50.00 |

10 - 45/15

---

## පදියතලාව ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට පරිසර බලපත්‍රයක් පැනවීම

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව 1523/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ "ඈ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ක්‍රියා පටිපාටියට අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම අළුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම.

පදියතලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු 2019.01.01 සිට පනවා අයකිරීමට 2018 ජූලි මස 18 දින ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 37 යටතේ තීරණය කළ බව මින් නිවේදනය කරනු ලැබේ.

දේශමාන්‍ය, දේශබන්දු
එච්. එම්. ලලන්ත සුමිත් සෙනවිරත්න,
සභාපති,
පදියතලාව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 18 වන දින,
පදියතලාව ප්‍රාදේශීය සභාව,
පදියතලාව.

**උපලේඛනය**

| | |
|---|---|
| බලපත්‍ර ගාස්තු වසර තුනක් (03) සඳහා එකවර | රු. 4000.00 |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් ගාස්තු | රු. 350.00 |
| වාර්ෂික බලපත්‍ර අළුත් කිරීමේ අයදුම්පත් ගාස්තු | රු. 350.00 |
| පරීක්ෂණ ගාස්තු | රු. 750.00 |
| මුද්දර බදු | 10% |

ප්‍රාදේශීය සභාව මගින් පරිසර බලපත්‍ර නිකුත් කරනු ලබන කර්මාන්ත

1. සියලු වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්තය.
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5. වියලි ක්‍රියාවලිය සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1000 කට අඩුවන ඇඹරුම්හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවයක් සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙර සවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 250ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියළු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝරවරයක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැනීම්.
18. දිනකට ඝණ මීටර් 50 ට අඩු දැව ඉරුම්ධාරිතවයකින් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 05 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 ට හෝ ඊට වැඩි සහ 20 ට අඩු හොටෙල්, ආගන්තුක නිවාස හා තානායම්
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ සහ සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුත සිදු කරන ගරාජ හැර අනෙකුත් වාහන අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.
22. ශීතකරණ, වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවි කිරීම සිදු කරන ස්ථාන
23. නහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත
24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියළු විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අළුත් වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුලත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

10 -45/16

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2018.11.02 | සිකුරාදා | 2018.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.09 | සිකුරාදා | 2018.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.16 | සිකුරාදා | 2018.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.23 | සිකුරාදා | 2018.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.30 | සිකුරාදා | 2018.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2018.12.07 | සිකුරාදා | 2018.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.14 | සිකුරාදා | 2018.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.21 | සිකුරාදා | 2018.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.28 | සිකුරාදා | 2018.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.